සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## කෘෂි හා ආහාර තාක්ෂණය - I

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 01යි.

සැ.යු

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) අතීතයේ දී ගොවිතැන යන සරල නමින් හඳුන්වන ලද කෘෂිකර්ම ක්ෂේත්‍රය කෘෂිකර්මාන්තය ලෙස හැඳින්වීමට හේතු වූයේ,
(1) කෘෂිකර්ම ක්ෂේත්‍රය බහුකාර්ය ක්‍රියාවලියක් ලෙස ක්‍රමයෙන් දියුණු වූ නිසා ය.
(2) ගොවිතැන යන්න හැඳින්වීමට වඩා කෘෂිකර්මාන්තය යන්න හැඳින්වීමට මිනිසුන් කැමති වූ නිසා ය.
(3) විශාල පරිමාණයෙන් මිනිසුන් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියුක්ත වූ නිසා ය.
(4) අනෙකුත් අපනයන බෝග මෙන් රටට විදේශ විනිමය මෙමගින් ලැබුනු නිසා ය.

(02) කෘෂිකර්මයේ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීමේ දී මිනිසා විවිධ යුග පසු කරමින් වර්තමානය දක්වා පැමිණ ඇති බව පෙනේ. මින් නිවැරදිව හා පිළිවෙලින් එම යුග දැක්වෙන්නේ,
(1) දඩයම් යුගය, ගොවි යුගය හා එඬේර යුගය වේ.
(2) එඬේර යුගය, ගොවි යුගය හා දඩයම් යුගය වේ.
(3) දඩයම් යුගය, එඬේර යුගය හා ගොවි යුගය වේ.
(4) ගොවි යුගය, එඬේර යුගය හා දඩයම් යුගය වේ.

(03) යෝධ ඇළ හෙවත් ජය ගඟ ඉතිහාසයේ අතිශයින් වැදගත් සන්ධිස්ථානයක් හිමිකර ගත් වාරි කර්මාන්තයකි. මෙය ඉදිකරන ලද්දේ,
(1) පණ්ඩුකාභය රජතුමා විසිනි.
(2) ධාතුසේන රජතුමා විසිනි.
(3) මහසෙන් රජතුමා විසිනි.
(4) වසභ රජතුමා විසිනි.

(04) අඹන් ගඟ හරස්කොට ඇළහැර නම් ස්ථානයේ දී අමුණක් ඉදිකර ඇළහැර ඇළ ඔස්සේ මින්නේරිය වැවට සහ කන්තලේ වැවට ජලය ලබා දෙන ලද්දේ,
(1) මහසෙන්, පැරකුම් සහ අග්බෝ යන රජවරුන්ගේ කාලවලදී ය.
(2) වසභ, මහසෙන් සහ ධාතුසේන යන රජවරුන්ගේ කාලවලදී ය.
(3) පරාක්‍රමබාහු, මහසෙන් සහ වසභ යන රජවරුන්ගේ කාලවලදී ය.
(4) වසභ, මහසෙන් සහ අග්බෝ යන රජවරුන්ගේ කාලවලදී ය.

(05) වර්තමානයේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ දැඩි අවධානයක් යොමු වී ඇත. ආහාර සුරක්ෂිතතාව යනුවෙන් අදහස් කෙරෙන්නේ,
(1) ආහාරවලට සාධාරණ මිලක් ලබාදීමයි.
(2) ආහාර නරක් නොවී දීර්ඝ කාලයක් ගබඩා කර තබා ගැනීමයි.
(3) අවශ්‍ය අවස්ථාවේ දී අවශ්‍ය ප්‍රමාණයට හා නියමිත ගුණාත්මයෙන් යුත් ආහාර ලබා ගැනීමට ඇති හැකියාවයි.
(4) ආහාර හිඟ වූ රටවලට ගුවන් මඟින් ආහාර ලබා දීමයි.

(06) හරිත විප්ලවය යනු,
(1) කෘෂි බෝග සමඟ වන වගාව සිදු කිරීම ය.
(2) හේන් වගා දියුණු කිරීම ය.
(3) යෙදවුම් අධිකව භාවිත කර කෘෂිකාර්මික ඵලදායිතාවය වැඩි කිරීම ය.
(4) පැරණි බෝග ප්‍රභේද වැඩිපුර වගා කර අස්වනු වැඩිකර ගැනීම ය.

(07) කාලගුණ මධ්‍යස්ථානවල උෂ්ණත්වය ප්‍රකාශ කිරීමට යොදා ගන්නා ඒකකය වන්නේ,
(1) මිලි බාර් ය. (2) පැස්කල් ය. (3) සෙල්සියස් ය. (4) මිලිමීටර් ය.

(08) අල බෝගවල ආකන්ද ඇතිවීම සඳහා,
(1) දහවල් වැඩි උෂ්ණත්වයක් සහ රාත්‍රී වැඩි උෂ්ණත්වයක් හිතකර ය.
(2) දහවල් වැඩි උෂ්ණත්වයක් සහ රාත්‍රී අඩු උෂ්ණත්වයක් හිතකර ය.
(3) දහවල් අඩු උෂ්ණත්වයක් සහ රාත්‍රී වැඩි උෂ්ණත්වයක් හිතකර ය.
(4) දහවල් අඩු උෂ්ණත්වයක් සහ රාත්‍රී අඩු උෂ්ණත්වයක් හිතකර ය.

(09) දිනයේ ආලෝකය පවතින කාල සීමාව දිවා කාලයේ දිග ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ දිවා කාලයේ දිග වැඩි ම දිනය ජුනි 21 වන අතර එදින දිවා කාලය වනුයේ,
(1) පැය 12 මිනිත්තු 30ක් වේ. (2) පැය 12 මිනිත්තු 50ක් වේ.
(3) පැය 12 මිනිත්තු 40ක් වේ. (4) පැය 11 මිනිත්තු 40ක් වේ.

(10) සංවහන වැසිවලට අයත් විශේෂ ලක්ෂණය වන්නේ,
(1) දවස මුළුල්ලේ ඇතිවන වර්ෂාව යි.
(2) රාත්‍රී කාලයේ පමණක් ඇතිවන සුළං සහිත වර්ෂාව යි.
(3) සවස් කාලයේ ඇතිවන ගිගුරුම් සහිත වර්ෂාව යි.
(4) සුළි කුණාටු සමඟ ඇතිවන වර්ෂාව යි.

(11) උපරිම හා අවම උෂ්ණත්වමානයක ද්‍රව ලෙස භාවිත වන්නේ,
(1) මධ්‍යසාර හා ජලය යි. (2) මධ්‍යසාර හා රසදිය යි.
(3) මධ්‍යසාර පමණි. (4) රසදිය පමණි.

(12) සුළගේ වේගය මැනීම සඳහා යොදා ගන්නේ,
(1) කොකුමානය යි. (2) සූර්ය දීප්ත මානය යි.
(3) අනිල මානය යි. (4) විකිරණමානය යි.

(13) වර්ෂාමානයකින් වඩාත් නිවැරදි පාඨාංක ලබාගැනීම සඳහා එය ස්ථාපනය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු කිහිපයක් පහත දැක්වේ.
(A) එළිමහන් ස්ථානයක සවිකළ යුතු ය.
(B) ආසන්න ගොඩනැගිල්ලේ උසට සමාන දුරින් වර්ෂාමානය ස්ථානගත කළ යුතු ය.
(C) පුනීල කට පොළොව මට්ටමේ සිට 15cm ක් උසින් සිටින සේ තැබිය යුතු ය.
(D) සමතලා තෘණ බිමක ස්ථාන ගත කළ යුතු ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය ප්‍රකාශ වන්නේ,
(1) A හා B පමණි. (2) A හා D පමණි.
(3) B හා C පමණි. (4) C හා D පමණි.

(14) යල කන්නයේ දී වී වගාව සඳහා බිම් සැකසීම කරනු ලබන්නේ
(1) මාර්තු - අප්‍රේල් මාසවල දී ය. (2) ඔක්තෝබර් - නොවැම්බර් මාසවල දී ය.
(3) මැයි - ජුනි මාසවල දී ය. (4) දෙසැම්බර් - ජනවාරි මාසවල දී ය.

(15) සූර්ය විකිරණ මානය භාවිත කරනු ලබන්නේ,
(1) ආලෝකය පවතින කාල සීමාව මැනීම සඳහා ය.
(2) ආලෝක තීව්‍රතාව මැනීම සඳහා ය.
(3) ආලෝකයේ ගුණාත්මක බව මැනීම සඳහා ය.
(4) සූර්යයාගෙන් පෘථිවිය මත පතිත වන කිරණ වර්ග මැනීම සඳහා ය.

(16) ශ්‍රී ලංකාව බෙදා ඇති කෘෂි දේශගුණික කලාප සංඛ්‍යාව වනුයේ,
(1) 05 කි. (2) 20 කි. (3) 07 කි. (4) 46 කි.

(17) ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප 42ක් ඇත.
(2) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයට උච්චත්වය පමණක් භාවිත කර ඇත.
(3) වැඩි ම කෘෂි පාරිසරික කලාප ගණනක් ඇත්තේ අතරමැදි කලාපයේ ය.
(4) කෘෂි පාරිසරික කලාප හැඳින්වීමට සම්මත සංකේත භාවිත කිරීමේ දී තනි ඉංග්‍රීසි අක්ෂරයක් පමණක් භාවිත වේ.

(18) සුළං දිශා දර්ශකයක ඊ හිස යොමු වී තිබුනේ ඊසාන දිශාවටය. මෙහි දී සුළං හමන දිශාව වනුයේ,
(1) නිරත දිග සිට ඊසාන දිශාවට ය. (2) ඊසාන සිට නිරිත දිග දිශාවට ය.
(3) දකුණු දිශාවේ සිට ඊසාන දිශාවට ය. (4) ඊසාන දිශාවේ සිට දකුණු දිශාවට ය.

(19) ශ්‍රී ලංකාවේ දැකිය හැකි විපරිත පාෂාණ වර්ගයක් වන්නේ,
(1) ග්‍රැනයිට් ය. (2) වැලිගල් ය. (3) නයිස් ය. (4) හුණුගල් ය.

(20) පසක් සෑදී ඇත්තේ ඛනිජ හා ඛනිජ නොවන සංඝටක වලිනි. මින් ඛනිජ නොවන සංඝටකයක් වන්නේ,
(1) රොන්මඩ ය. (2) පාංශු කාබනික ද්‍රව්‍ය ය.
(3) මැටි ය. (4) සියුම් වැලි ය.

(21) ජාත්‍යන්තර ක්‍රමය අනුව ඛනිජ සංඝටක වර්ගීකරණයේ දී මැටි අංශුවක විශ්කම්භය
(1) මිලිමීටර් 0.0002ට වඩා අඩු ය. (2) මිලිමීටර් 0.02ට වඩා අඩු ය.
(3) මිලිමීටර් 0.002ට වඩා අඩු ය. (4) මිලිමීටර් 0.02 - 0.2 අතර වේ.

(22) බෝග වගාවට සුදුසු පසක තිබිය යුතු ප්‍රශස්ත පාංශු වාතය ප්‍රතිශතය වන්නේ,
(1) 25%කි. (2) 50%කි. (3) 45%කි. (4) 05%කි.

(23) බෝගයක් සාර්ථකව වර්ධනය වීම සඳහා පසේ තිබිය යුතු ප්‍රශස්ත ජල තත්ත්වය වන්නේ,
(1) ක්ෂේත්‍ර ධාරිතාව යි.
(2) සංතෘප්ත ප්‍රතිශතය යි.
(3) ක්ෂේත්‍ර ධාරිතාව සහ සංතෘප්ත ප්‍රතිශතය අතරමැදි අවස්ථාව යි.
(4) මැලවීමේ අංකය සහ ක්ෂේත්‍ර ධාරිතාව අතරමැදි අවස්ථාව යි.

(24) පාංශු වාතය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,
(1) පාංශු වාතය සියලු පාංශු ජීවීන්ගේ ශ්වසනයට අත්‍යවශ්‍ය වේ.
(2) පාංශු වාතය කාබනික ද්‍රව්‍ය වියෝජනයට අවශ්‍ය වේ.
(3) පාංශු වාතය පාංශු ජනනය සඳහා උපකාරී වේ.
(4) පාංශු වාතය පාංශු ඛාදන ක්‍රියාවලිය වැළැක්වීමට උපකාරී වේ.

(25) ශිෂ්‍යයෙක් බඳුනක වම්බටු පැළයක් සිටුවා එයට වැඩිපුර ජලය යෙදුවේය. බඳුනේ පතුලේ ඇති සිදුරු වලින් අතිරික්ත ජලය සියල්ල ඉවත් වූ විට එම පසෙහි අඩංගු වන්නේ,

(1) කේශාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලය වේ.

(2) ජලාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලය වේ.

(3) ජලාකර්ෂණ ජලය හා කේශාකර්ෂණ ජලය වේ.

(4) ජලාකර්ෂණ ජලය පමණි.

(26) කාබනික ද්‍රව්‍ය සහිත පස් ආහාරයට ගනිමින් පසේ භෞතික ලක්ෂණ දියුණු කිරීමට ආධාර වන සත්ත්ව විශේෂය වන්නේ,

(1) ගැඩවිලුන් ය. (2) කුහුඹුවන් ය. (3) කුරුමිණියන් ය. (4) වේයන් ය.

(27) පාංශු ජීවින්ගේ වර්ධනයට යෝග්‍ය වන පරිදි පාංශු පරිසරය පවත්වා ගැනීම සඳහා කළ යුත්තේ,

(1) පසට රසායනික පොහොර යෙදීම හා ජලය යෙදීම ය.

(2) පස බුරුල් කිරීම හා කාබනික ද්‍රව්‍ය යෙදීම ය.

(3) පස බුරුල් කිරීම හා රසායනික පොහොර යෙදීම ය.

(4) පසට රසායනික ද්‍රව්‍ය යොදා පස පෙරලීම ය.

(28) පාසල් වත්තේ බිම් සැකසීමෙන් පසු උපකරණ සෝදා හරින ලද ස්ථානයේ වූ කුඩා කාණුව වැලි හා ගල්කැට වලින් අවහිර වී තිබුණු අතර ජලය බොර පැහැයෙන් යුක්ත විය. එම බොර පැහැති ජලයෙහි අඩංගු විය හැක්කේ,

(1) වැලි හා ගල්කැට ය. (2) රොන්මඩ හා වැලි ය.

(3) රොන් මඩ හා මැටි ය. (4) වැලි හා මැටි ය.

(29) පාංශු අවකාශවල ඇති ජලයේ පාංශු පෝෂක දියවීම නිසා සෑදෙන්නේ,

(1) පාංශු කලල සංකීර්ණය යි. (2) පාංශු ද්‍රාවණය යි.

(3) පාංශු ප්‍රතික්‍රියාව යි. (4) පාංශු pH අගය යි.

(30) පස හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

(A) පසේ කැටිති ව්‍යූහය බෝග වගාවට වඩාත් සුදුසු වේ.

(B) මැටි අධික පසකට වැලි එකතු කිරීමෙන් පාංශු වයනය දියුණු කළ හැකි ය.

(C) පසේ අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය අධික නම් එවැනි පසක් තද රතු පැහැයක් ගනී.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි.

(3) B හා C පමණි. (4) A, B හා C යන ප්‍රකාශ සියල්ල සත්‍ය වේ.

(31) යම් පසක ඇති වැලි, මැටි සහ රොන්මඩ ප්‍රමාණය දැන ගැනීමෙන් එම පසේ පහත දැක්වෙන කිනම් ලකෂණය තීරණය කරගත හැකිවේ ද?

(1) පාංශු ව්‍යූහය (2) පාංශු වයනය

(3) පාංශු උෂ්ණත්වය (4) පාංශු ජීවින් ප්‍රමාණය

(32) දුර්වල පාංශු ව්‍යූහයක් සහිත පසක එම තත්වය මග හරවා ගැනීම සඳහා ඔබ නිර්දේශ කරන වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ක්‍රමය වන්නේ,

(1) පස නිතර පෙරලීමය. (2) පසට වැලි එකතු කිරීම ය.

(3) පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම ය. (4) පසට රසායනික පොහොර එකතු කිරීම ය.

(33) මැටි පසක් හා සසඳන විට වැලි පසක

(1) අවකාශ ප්‍රමාණය අඩු ය. (2) වයනය රළුය.

(3) ජලය රඳවා ගැනීමේ ශක්තිය වැඩි ය. (4) පාංශු වාතය අඩු ය.

(34) පහත සඳහන් පාංශු ලක්ෂණ අතුරින් රසායනික ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) පාංශු ව්‍යුහය (2) පාංශු වර්ණය
(3) පාංශු වාතය (4) පාංශු කැටායන හුවමාරුව

(35) පසක pH අගය නිර්ණය කිරීමේ දී එහි අගය 7.5 ක් විය. එම පස
(1) ප්‍රබල ආම්ලික පසකි. (2) ප්‍රබල භාෂ්මික පසකි.
(3) උදාසීන පසකි. (4) භාෂ්මික පසකි.

(36) පසක භෞතික, රසායනික හා ජෛව ගුණාංග වගාවට අයහපත් වීම මඟින් බෝග නිෂ්පාදන ශක්තිය හීනවීම හඳුන්වනු ලබන්නේ,
(1) පාංශු ඛාදනය ලෙස ය. (2) පාංශු හායනය ලෙස ය.
(3) පාංශු ජනනය ලෙස ය. (4) පාංශු ජීර්ණය ලෙස ය.

(37) පාංශු ඛාදනය වළක්වා ගැනීම සඳහා වගා කළ හැකි ආවරණ බෝගයක් වන්නේ,
(1) අඩනහිරියා වේ. (2) පියුරේරියා වේ.
(3) ග්ලිරිසීඩියා වේ. (4) ඇල්බීසියා වේ.

(38) ශ්‍රී ලංකාවේ අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව හා හම්බන්තොට ප්‍රදේශ ඇතුළු වියළි කලාපයේ දක්නට ලැබෙන ප්‍රධාන පස් කාණ්ඩය වන්නේ,
(1) රතු, දුඹුරු පස ය. (2) දියලු පස ය.
(3) රතු කහ ලැටසෝල් පස ය. (4) රතු කහ පොඩ්සොලික් පස ය.

(39) ආම්ලික පසක් බෝග වගාවට යෝග්‍ය ආකාරයට සැකසීම සඳහා කළ යුත්තේ,
(1) පසට ජිප්සම් යෙදීම ය. (2) පසට හුණු යෙදීම ය.
(3) පසට ගෙන්දගම් යෙදීම ය. (4) පසට කාබනික ද්‍රව්‍ය යෙදීම ය.

(40) පාංශු කැටායන හුවමාරු ධාරිතාව රඳා පවතින්නේ එම පසෙහි ඇති
(1) වැලි හා රොන්මඩ ප්‍රමාණය මත ය.
(2) වැලි හා බොරළු ප්‍රමාණය මත ය.
(3) හියුමස් හා රොන්මඩ ප්‍රමාණය මත ය.
(4) මැටි හා හියුමස් ප්‍රමාණය මත ය.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## කෘෂි හා ආහාර තාක්ෂණය - II

නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 02යි.

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ එක්තරා පාසලක 10 ශ්‍රේණියේ සිසුන් පිරිසක් ගොවිපළක් නැරඹීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක නියැලුණි. එහි දී එම සිසුන්ට පහත සඳහන් දෑ නිරීක්ෂණය කිරීමට හැකිවිය.

කාලගුණ විද්‍යා ඒකකය

වැවක ආකෘතියක්

වගා කරන ලද විවිධ බෝග වර්ග

(i) කාලගුණ විද්‍යා ඒකකයේ ස්ථානගත කර ඇති වර්ෂාපතනය මැනීමට භාවිතා කරන උපකරණය නම් කරන්න.

(ii) වර්ෂාපතනය මැනීමට යොදා ගන්නා සම්මත ඒකකය සඳහන් කරන්න.

(iii) කාලගුණ ඒකකයේ පිහිටුවා ඇති තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය භාවිතා කරන්නේ කුමන කාර්යයක් සඳහා ද?

(iv) වැවක දක්නට ලැබෙන ප්‍රධාන අංග හතරක් නම් කරන්න.

(v) එම අංග 04 මගින් ඉටුවන කාර්යයන් වෙන වෙනම දක්වන්න.

(vi) බෝගවල ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලියට වැදගත්වන වර්ණ දෙකක් සඳහන් කරන්න.

(vii) පාෂාණවලින් පස නිර්මාණය වීමේ ක්‍රියාවලිය පහත දැක්වේ.

පාෂාණ —A→ මාතෘ ද්‍රව්‍ය —B→ පස

ඉහත A හා B අවස්ථා දෙක නම් කරන්න.

(viii) මෙම ගොවිපළේ දක්නට ලැබෙන ප්‍රධාන පස් කාණ්ඩය සඳහන් කරන්න.

(ix) ඉහත සඳහන් ගොවිපලේ පසෙහි pH අගය මැනීම සඳහා භාවිත කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(x) පසක දක්නට ලැබෙන පාංශු කලිල වර්ග දෙකක් සඳහන් කරන්න.

(02) අතීතයේ ගොවිතැන ලෙස හැඳින් වූ කෘෂිකර්ම ක්ෂේත්‍රය ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ.

(i) (අ) එම අංශ දෙක නම් කරන්න.

(ආ) අභය වැව ඉදිකරන ලද්දේ කුමන යුගයක ද?

(ii) (අ) අතීතයේ දී ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිත විය. ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුනු බවට සාක්ෂි දෙකක් ඉදිරිපත් කරන්න.

(ආ) අප රටේ දළ දේශීය නිෂ්පාදනයට දායකවන ප්‍රධාන අංශ තුනක් සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය සඳහා ඇති විභවයන් හතරක් නම් කරන්න.

(03) ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය අනුව දේශගුණික කලාප වෙන් කර ඇති සිතියමක් පහත දැක්වේ.




(i) (අ) A, B හා C දේශගුණික කලාප නම් කරන්න.

A - B - C -

(ආ) A, B, C දේශගුණික කලාපවලට ලැබෙන වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණය සඳහන් කරන්න.

A - B - C -

(ii) (අ) A දේශගුණික කලාපයට වසරේ වැඩි ම වර්ෂාපතනයක් ලැබෙන්නේ කුමන මෝසම් සුළං මගින් ද?

(ආ) එම වර්ෂාපතනය ලැබෙන කාලසීමා සඳහන් කරන්න.

(iii) C දේශගුණික කලාපය බෙදා ඇති කෘෂි දේශගුණික කලාප ගණන කීය ද? ඒ මොනවා ද?

(04) කෘෂිකාර්මික කටයුතු පහසුකර ගැනීම සඳහා අවශ්‍ය වන කාලගුණික දත්ත ලබාගැනීමට විවිධ උපකරණ භාවිත කරනු ලැබේ. පහත දක්වා ඇත්තේ එවැනි උපකරණ 02කි.

A

B 


(i) (අ) ඉහත A හා B උපකරණ නම් කරන්න.

A - ...................................... B - ......................................

(ආ) එම උපකරණ භාවිත කරන්නේ කුමන කාර්යයක් සඳහා ද?

A - ...................................... B - ......................................

(ii) (අ) ප්‍රභාඅවධි සංවේදිතාව යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) දිගු දින ශාක වගා කරන්නේ කුමන වගා කන්නයේ ද?

(iii) (අ) පරිසර උෂ්ණත්වය ප්‍රදේශය අනුව වෙනස් වේ. මෙම වෙනස්වීම කෙරෙහි බලපාන සාධක 04ක් සඳහන් කරන්න.

(ආ) බෝග වගාවේ දී උෂ්ණත්වයේ හිතකර බලපෑම් 02ක් සඳහන් කරන්න.

(05) පහත දැක්වෙන්නේ දර්ශීය පාංශු පැතිකඩක රූප සටහනකි.




(i) (අ) පාංශු පැතිකඩක් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(ආ) දර්ශීය පාංශු පැතිකඩක් ලබාගත හැකි ස්ථානයක් නම් කරන්න.

(ii) (අ) ඉහත රූප සටහනේ A, B, C හා R කොටස් හඳුන්වන්න.

A - C -

B R -

(ආ) පාංශු පැතිකඩක පාංශු ජීවීන් බහුලව සිටින ස්ථර / කලාප මොනවා ද?

(iii)(අ) පාංශු පැතිකඩෙහි A, B හා C කලාප වල මුළු උස කුමන නමකින් හැඳින්වේ ද?

(ආ) O ස්ථරයේ බහුලව දැකිය හැකි ද්‍රව්‍ය මොනවා ද?

(06) යම් පාෂාණයක් විවිධ සාධකවල බලපෑමෙන් කුඩා කැබලිවලට පත්වීම භෞතික ජීර්ණයයි.

(i) (අ) පාෂාණ ජීර්ණය සඳහා බලපාන භෞතික සාධක 04ක් නම් කරන්න.

(ආ) පසක කාබනික ද්‍රව්‍ය පැවතීමෙන් ලැබෙන වාසි 02ක් සඳහන් කරන්න.

(ii) (අ) පසක් ක්ෂාරීයවීම බෝග වගාවේ දී ඇතිවන ගැටළුවකි. ක්ෂාරීයතාවයට පත් වූ පසක් යථා තත්ත්වයට පත්කර ගැනීමට යෙදිය හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.

(ආ) කෘෂිකර්මාන්තයේ දී වගා බිමක පාංශු වයනය දැන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන 02ක් සඳහන් කරන්න.

(iii) වගා බිමක සිටින පාංශු ජීවීන්ගෙන් ලැබෙන වාසි 02ක් හා අවාසි 02ක් සඳහන් කරන්න.

(07) කෘෂිකර්මාන්තයේ දී බෝග වගා කෙරෙන ප්‍රධාන උපස්තරය හෙවත් වගා මාධ්‍යය පසයි. පස ඛාදනය වීමෙන් එහි ගුණාංග පිරිහී යා හැකි ය.

(i) (අ) පාංශු ඛාදන ක්‍රියාවලියෙහි පියවර 03ක් නම් කරන්න.

(ආ) පාංශු ඛාදන කාරක 02ක් නම් කරන්න.

(ii) පාංශු ඛාදනයේ අහිතකර බලපෑම් 04ක් සඳහන් කරන්න.

(iii) (අ) පසක් තදවීමට හේතු 02ක් සඳහන් කරන්න.

(ආ) පසේ තදබව නිසා ඇතිවන අහිතකර බලපෑම් 02ක් සඳහන් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## කෘෂි හා ආහාර තාක්ෂණය - පිළිතුරු

I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. 1 | 02. 3 | 03. 2 | 04. 4 | 05. 3 |
| 06. 3 | 07. 3 | 08. 2 | 09. 1 | 10. 3 |
| 11. 2 | 12. 2 | 13. 2 | 14. 1 | 15. 2 |
| 16. 3 | 17. 3 | 18. 2 | 19. 3 | 20. 2 |
| 21. 3 | 22. 1 | 23. 1 | 24. 4 | 25. 3 |
| 26. 1 | 27. 2 | 28. 3 | 29. 2 | 30. 1 |
| 31. 2 | 32. 3 | 33. 2 | 34. 4 | 35. 4 |
| 36. 2 | 37. 2 | 38. 1 | 39. 2 | 40. 4 |

(ලකුණු 1 × 40 = 40)

II පත්‍රය

(01) (i) වර්ෂාමානය (ලකුණු 02)

(ii) මිලිමීටර් (ලකුණු 02)

(iii) සාපේක්ෂ ආර්ද්‍රතාව මැනීම සඳහා (ලකුණු 02)

(iv) සොරොව්ව, බිසෝකොටුව, වැව් බැම්ම, සලපනාව, පිටවාන (ලකුණු 1/2 × 4 = 02)

(v) පිළිතුරු සපයා ඇති අංග 04 සඳහා ඉටුවන කාර්යයන් නිවැරදිව දැක්වීමට (ලකුණු 1/2 × 4 = 02)

(vi) නිල් සහ රතු වර්ණ (ලකුණු 1 × 2 = 02)

(vi) A - පාෂාණ ජීර්ණය B - පාංශු ජනනය (ලකුණු 1 × 2 = 02)

(viii) රතු කහ පොඩ්සොලික් පස (ලකුණු 02)

(ix) pH කඩදාසි මගින් , pH මීටර මගින් (ලකුණු 1 × 2 = 02)

(x) මැටි හා හියුමස් (ලකුණු 1 × 2 = 02)

(මුළු ලකුණු 20)

(02) (i) (අ) බෝග වගාව, සත්ත්ව පාලනය (ලකුණු 1 × 2 = 02)

(ආ) අනුරාධපුර යුගය (ලකුණු 01)

(ii) (අ)
- ''අහසින් වැටෙන එක දිය බිඳුවක් හෝ මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යාමට ඉඩ නොතැබිය යුතුය'' යන පරාක්‍රමබාහු රජුගේ කියමනින්.
- කෘෂිකාර්මික කටයුතු සඳහා රජවරු වැව් රැසක් ඉදි කිරීම.
- මහසෙන් රජු මින්නේරිය දෙවියන් ලෙස දේවත්වයෙන් පුදුනු ලැබුවේ ඔහු කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජල සම්පාදනයට ඉහළ අනුග්‍රහයක් දක් වූ නිසාය. (ලකුණු 1 × 2 = 02)

(ආ) • කෘෂිකාර්මික අංශය • කාර්මික අංශය • සේවා අංශය (ලකුණු 1 × 3 = 03)

(iii)
- කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය සම්පත් සුලබ වීම.
- කෘෂිකර්මාන්තය සඳහා හිතකර වූ විවිධ පරිසර තත්ත්ව පැවතීම.
- ගුණාත්මක ව්‍යාප්ති සේවා සහ උපකාරක සේවා රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ මගින් රටපුරා ක්‍රියාත්මක කිරීම.

- කෘෂි කාර්මික නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළෙඳ පොලක් පැවතීම.
- දේශීය හා විදේශීය ව්‍යාවසායකයින්ගේ දායකත්වය ලබා ගත හැකි වීම.
- යටිතල පහසුකම් යහපත් මට්ටමක පැවතීම.
- කෘෂිකර්මාන්තයට හිතකර වූ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම.

(ලකුණු 1/2 × 4 = 02)
(මුළු ලකුණු = 10යි )

(03) (i) (අ) A - වියලි කලාප B - අතරමැදි කලාපය C - තෙත් කලාපය (ලකුණු 1/2 × 3 = 1 1/2)
(ආ) A - 1750 mm ට වඩා අඩු
B - 1750 mm - 2500mm අතර
C - 2500 mm හෝ ඊට වැඩි (ලකුණු 1/2 × 3 = 1 1/2)
(ii) (අ) ඊසාන දිග මෝසම් සුළං මගින් (ලකුණු 01)
(ආ) දෙසැම්බර් - පෙබරවාරි (ලකුණු 02)
(iii) දේශගුණික කලාප 03කි. (ලකුණු 01)
උඩරට තෙත් කලාපය, මැදරට තෙත් කලාපය, පහතරට තෙත් කලාපය (ලකුණු 1 × 3 = 03)
(මුළු ලකුණු 10යි)

(04) (i) (අ) A - අනිල මානය B - සුළං දිශා දර්ශකය (ලකුණු 1 × 2 = 02)
(ආ) A - සුළගේ වේගය මැනීමට B - සුළගේ දිශාව මැනීමට (ලකුණු 1/2 × 2 = 01)
(ii) (අ) පුෂ්ප හට ගැනීමේ දී දිවා කාලයේ දිග කෙරෙහි ශාක දක්වන ප්‍රතිචාරය ප්‍රභා අවධි සංවේදීතාව ලෙස හැඳින් වේ. (ලකුණු 02)
(ආ) යල කන්නයේ දී . (ලකුණු 01)
(iii) (අ)
- සමකයේ සිට ඇති දුර
- මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය
- අභ්‍යන්තර ජලය පිහිටා තිබීම
- උච්චත්වය
- වන ගහනය
- මිනිස් ක්‍රියාකාරකම් (ලකුණු 1/2 × 4 = 02)

(ආ)
- බීජ ප්‍රරෝහනය සඳහා
- ප්‍රභාසංස්ලේෂණය සඳහා
- දඬු කැබලි මුල් අද්දවා ගැනීමට
- උත්ස්වේදනය සඳහා
- අලබෝගවල ආකන්ද ඇතිවීම සඳහා දහවල් වැඩි උෂ්ණත්වය සහ රාත්‍රී අඩු උෂ්ණත්වය හිතකර වේ.
- සෞම්‍ය කලාපික බෝගවල පුෂ්ප පිපීමට අඩු උෂ්ණත්වයක් හිතකර වේ.
- වැඩි උෂ්ණත්වයක දී පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වැඩි වේ. (ලකුණු 1 × 2 = 02)

(මුළු ලකුණු 10යි)

(05) (i) (අ) පස මතුපිට සිට මව් පාෂාණය දක්වා පාංශු කලාප පෙන්නුම් කරන පසේ සිරස් කඩක් පාංශු පැතිකඩක් ලෙස හැඳින් වේ. (ලකුණු 02)
(ආ) මිනිසාගේ බලපෑම අවම තත්ව යටතේ පවතින ස්වභාවික වනාන්තර, ස්වාභාවික තෘණ භූමි (ලකුණු 01)
(ii) (අ) A - විශෝධන කලාපය (උඩුපස)
B - සංචායක කලාපය (යටිපස)
C - මාතෘ පාෂාණ ජීර්ණය වී හටගන්නා මාතෘ ද්‍රව්‍ය
R - මාතෘ පාෂාණය. (ලකුණු 1/2 × 4 =02)

(ආ) O හා A (ලකුණු 1 × 2 = 02)
(iii) (අ) පාංශු ගැඹුර (ලකුණු 02)
(ආ) කාබනික ද්‍රව්‍ය (ලකුණු 01)
(මුළු ලකුණු 10යි)

(06) (i) (අ) උෂ්ණත්වය වෙනස් වීම, ජලය මිදීම, ගලායන ජලය , රළක්‍රියා, සුළඟ, සතුන්, මිනිසා, ග්ලැසියර , ශාක මුල්, භූමි කම්පා (ලකුණු 1/2 × 4 = 02)

(ආ)
- කුඩා පස් අංශු එකට බඳවා තබා පාංශු කැටිති සෑදීම.
- පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කිරීම.
- ශාක වර්ධනයට අවශ්‍ය පෝෂක රඳවා තබා ගැනීම.
- පාංශු ඛාදනය අඩු කිරීම.
- පාංශු ජීවීන්ගේ වර්ධනයට හිතකර ලෙස ක්‍රියා කිරීම.
- වැඩි තාප ප්‍රමාණයක් අවශෝෂණය කරගත හැකි වීම.
- පසේ ජලවහනය දියුණු කිරීම.
- හියුමස් මගින් පසේ කළිල ගුණාංග වැඩි දියුණු කිරීම.
- පස ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කිරීම. (ලකුණු 1/2 × 2 = 01)

(ii) (අ) පසට ජිප්සම් එකතු කිරීම.
පසට ගෙන්දගම් එකතු කිරීම.
පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම. (ලකුණු 1/2 × 2 = 01)

(ආ)
- පසට ගැළපෙන බෝග තෝරාගැනීමට හැකි වීම.
- වගාවට සුදුසු පරිදි වයනය දියුණු කර ගැනීම සඳහා
- බිම් සැකසීමට සුදුසු උපකරණ තෝරා ගැනීම සඳහා.
- පාත්තිවල උස තීරණය කිරීම සඳහා.
- උචිත ජල සම්පාදන ක්‍රම තෝරා ගැනීම සඳහා.
- පාංශු සංරක්ෂණ ක්‍රම තෝරා ගැනීම සඳහා. (ලකුණු 1 × 2 = 02)

(iii) වාසි
- කාබනික ද්‍රව්‍ය වියෝජනය කිරීම උදා:- දිලීර, බැක්ටීරියා
- පස මිශ්‍ර කිරීම. උදා:- ගැඩවිල් පණුවන්
- ඇලෙන සුළු ද්‍රව්‍ය පිට කිරීම නිසා පාංශු කැටිති ඇති වීම පහසු කිරීම.
- නයිට්‍රජන් තිර කිරීම. (ලකුණු 1 × 2 = 02)

අවාසි
- සමහර ජීවීන් ශාකවලට රෝග බෝකිරීම.
- නයිට්‍රිහරණය මගින් ශාක පෝෂකයක් වන N පසෙන් ඉවත් කිරීම.
- ශාකවලට පළිබෝධ ලෙස ක්‍රියා කිරීම උදා:- වේයන් (ලකුණු 1 × 2 = 02)

(මුළු ලකුණු = 10)

(07) (i) (අ)
- පාංශු දේහයෙන් පාංශු අංශු හා සමූහන වෙන් වීම.
- වෙන් වූ පාංශු සමූහන හා පාංශු අංශු වෙනත් ස්ථානයක් වෙතට ගසාගෙන යාම.
- එසේ ගසාගෙන ආ පාංශු කොටස් වෙනත් ස්ථානයක තැන්පත් වීම. (ලකුණු 1 × 3 = 03)

(ආ) වර්ෂා ජලය, වේගවත් සුළඟ, මුහුදු රළ හා මිනිසුන්ගේ හා සතුන්ගේ ක්‍රියාකාරකම් (ලකුණු 1/2 × 2 = 01)

(ii)
- ශාක වර්ධනය සඳහා සුදුසු පාංශු ස්ථරයේ ඝනකම අඩු වීම.
- ශාක පෝෂණ ඌනතාවලට ගොදුරු වී වර්ධනය බාල වීම.
- මූල මණ්ඩල අවට පස සෝදා යාම නිසා ගස් ඇදවැටීම.
- කෘෂිකාර්මික ඉඩම්වල වටිනාකම අඩු වීම.
- ඉවත්වන පස් ජලාශවල තැන්පත් වීම නිසා ඒවා ගොඩවීමෙන් ගං වතුර ඇති වීම. (ලකුණු 1/2 × 4 = 02)

(iii) (අ) පස මතුපිටින් බර යන්ත්‍රෝපකරණ නිතර ගෙන යාම.
කම්කරුවන් නිතර ඇවිදීම.
දීර්ඝකාලයක් තිස්සේ එකම ගැඹුරකට සී සෑම. මෙමගින් යටි පසේ තද ස්ථර ඇති වේ. (ලකුණු 1 × 2 = 02)

(ආ)
- පාංශු අවකාශ අඩුවීම, ශාක මුල් හා ක්ෂුද්‍ර ජීවී ශ්වසනයට බාධා පැමිණ වීම.
- ශාක මුල්වල වර්ධනයට බාධා ඇති වීම.
- ක්ෂුද්‍ර ජීවී වර්ධනයට බාධා ඇති වීම.
- කාබනික ද්‍රව්‍ය ජීර්ණය වීමේ හැකියාව අඩු වීම.
- පස තුළට ජලය අවශෝෂණය අඩු වීම.
- පසේ ජලවහනය දුර්වල වීම.
- බිම් සැකසීමේ කටයුතු අපහසුවීම. (ලකුණු 1 × 2 = 02)

(මුළු ලකුණු 10)